ගුරු පියාණන්ගේ
ජන්ම දිනය නිමිත්තෙන්
ගංගාරාම විහාරස්ථානයේ
පැවති පිංකම්
මාලාව.










සෑම
ඉරු දිනකම
මෙත් සවිය වැඩසටහන්
මාලාව අතර තුර
කාන්තා කමිටුව විසින්
ගිලන්පස සකසා
සුපිංවතුන්හට
ලබාදීම









මෙත් සවිය
සාමාජිකයින් මහියංගන
රාජමහා විහාරස්ථානයේ දී
බුදුපිළිමය ඉදිකිරීමට
අධාර එකතු කිරීම.





වැල්ලවත්ත
ශ්‍රී විජයාරාමයේ දී
මෙත් සවිය
සාමාජිකයින් වෙත,
තරුණ කමිටුව විසින්
"අසරණ සරණ"
කැට බෙදාදීම.





2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේගේ
ලය ප්‍රදේශයේ

# ගර්භ නිධානෝත්සවය

## 2020 ජනවාරි 10 දුරුතු පොහෝ දින

































මාසයේ ප්‍රථම
ඉරුදිනවල දී මෙත් සවිය
විසින් බොරැල්ල ධම්ගවේෂි
බෞද්ධාශ්‍රමයේ දී පවත් වූ
මාසික ධර්ම දේශනා
මාලාවන්ගෙන්
බිඳක්...










මෙත් සවිය
බුදුපිළිම කමිටුව
මහියංගනය රාජමහා
විහාරාධිපතිතුමන් හමුවී
බුදු පිළිමයේ ඉදිකිරීමේ
ඉදිරි කටයුතු පිළිබඳ
සාකච්ඡා කිරීම.






මෙත් සවිය
මගින් වෙනත්
බෞද්ධ සිද්ධස්ථාන
වෙත ගොස් පවත්වන ලද
වැඩසහටන්
මාලාවන්ගෙන්
බිඳක්...


















# රතන සූත්‍රයේ බලමහිමය

දිනක් බුදුරජාණන් වහන්සේ වෙත ආවා කුඩා දරුවෙක් වඩා ගත්ත මව්පිය දෙපළක්. මේ දෙදෙනා කෝලිය ජනපදයේ දීඝලම්බ ගමේ ගම්වාසීන් දෙදෙනෙක්. ඉතින් මේ දෙන්නගේ එකම පුතා. මේ පුතා වඩාගෙන ගියා තමන්ගේ හිතමිත්‍ර තාපසයාණන් වහන්සේ නමක් ළඟට.

ඉස්සර වෙලා මව්පියෝ දෙන්න වැන්දා ම දීර්ඝායු පැතුවා. පුතාට දීර්ඝායුෂ පතන්න කිව්වාම තාපසයන් වහන්සේ කිව්වා 'මේ දරුවාට තියෙන්නේ දවස් හතයි. ආයුෂ. දීර්ඝායුෂ පැතුවත් නිශ්ඵල'යි කිව්වා. ඉතින් හඬලා කිව්වා මේ දරුවාට දීර්ඝායුෂ ලැබීමට අපට උපදේශයක් ලබාදෙනු මැනවි. තාපසයන් වහන්සේ අවංකවම කිව්වා 'ඒක නම් මම දන්නේ නැහැ. අන්න අර ආරණ්‍ය සේනාසනයේ ඉන්නවා සිද්ධාර්ථ ගෞතම නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ. ගිහින් වැඳ නමස්කාර කර උන්වහන්සේගෙන් විමසා ගන්න' කියල. මේ දෙන්න ගෙදර නොගිහින් කෙළින්ම ගියා බුදුරජාණන් වහන්සේ සොයා ගෙන. මව්පියන් දෙදෙනා වඳින කොට සර්වඥයන් වහන්සේ 'සුඛී හොතු!, දීඝායුකො හොතු! කියලා සෙත් පැතුවා. දරුවාට සෙත් පැතුවේ නැහැ. අර වගේ ම සෙත් පතන්න ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේ වදාළා දරුවාට දවස් හතයි ආයුෂ තියන්නේ. ඒ නිසා සෙත් පැතීම නිශ්ඵලයි.

ආරාධනා කළා අනේ අපට ඉන්නෙත් මෙච්චරයි. ඉතින් මේ දරුවාට දීර්ඝායුෂ ලැබෙන්න. අපල ගෙවෙන්න අපට උපදේශයක් දෙනු මැනව. සර්වඥයන් වහන්සේ උපදෙස් දුන්නා. තමන්ගේ නිවස ඉදිරියේ මණ්ඩපයක් ඉදි කරන්න. භික්ෂූන් වහන්සේලාට අට නමකට, දහ නමකට, දොළොස් නමකට, දහසය නමකට තරම් වටේට ආසන පණවන්න. මේ කුඩා දරුවාටත් නිදාගන්න මැද්දේ ආසනයක් පණවන්න. සංඝරත්නය වඩා හිඳුවා දින හතක් රතන සූත්‍රය පවත්වන්න උපදෙස් දුන්නා. මේ දෙන්නා කිව්වා. ස්වාමිනි අපට මණ්ඩලය ඉදි කරන්නටත් පුළුවන්. සිව්පස සංග්‍රහ කරන්නත් පුළුවන්. අපට ස්වාමීන් වහන්සේලා කොහෙන් ද? බුදුරජාණන් වහන්සේ වදාලා ස්වාමීන් වහන්සේලා ලබා දෙන්ට මට පුළුවන්.

මේ දෙන්නා වහාම ගෙදර ගොස් ඉක්මණින් ම අසල්වැසියන්ද සම්බන්ධ කර ගෙන මණ්ඩපයක් ඉදි කරලා ආවා. සංඝයා වහන්සේලා වැඩම කර ගෙන යන්න. ස්වාමීන් වහන්සේලා අට නමක් ලැබුණා. මේ අට නමම මණ්ඩපයේ වඩා හිඳවාගෙන රෑ දාවල් රතන සූත්‍රාන්ත දේශනයම පැවැත්වූවා. වෙලාවට උන්වහන්සේලාට පිණ්ඩපාතය පිරි නමනවා. ගිලන්පස පිළිගන්වනවා. පහසු ගන්න සලසනවා. අනෙක් හැම වෙලාවෙම රතන සූත්‍රාන්ත දේශනාව පවත්වනවා.

හත්වෙනි දවසේ සර්වඥයන් වහන්සේ එතනට වැඩියා. අහස පුරා දෙව් දේවතාවෝ රැස්වුනා. ඒ අතර මේ කුඩා දරුවා මැද්දේ සතප්පවා ගෙන පිරිත් කියමින් තිබුණේ. මේ දරුවාට වෛර යක්ෂයෙක් හිටියා අවරුද්ධ කියලා. ඒ යක්ෂයාට වෛශ්‍රවණ දිව්‍ය රාජයාගෙන් අවසර ලැබිලා තිබුණා. මේ දරුවා ගෙනියන්න. නමුත් ඔහු එදින එන්න තිබුණාට එන්න බැරිවුනා. සක්දෙව් රජ ප්‍රධාන සතර වරම් දෙවියන් සහිත බොහෝ මහේශාක්‍ය දෙවියෝ අහස පුරා රැස්වී සිටියා. මේ ධර්මයට සවන් දී ගෙන. ඒ නිසා ඔහුට එන්න බැරිවුනා. යන්න ගියා. දිනය ඉකුත් වුනාට පස්සේ ගන්න කැප නෑ. ඉතින් උදේ පාන්දර වෙන කොට පිරිත හමාර කළා. මේ දෙමව්පියන් දෙදෙනා දරුවා ලවා බුදු පාමුල වැන්දෙව්වා. ඒ වෙලාවේදී 'සුඛී හොතු!, දීඝායුකො හොතු!, කියල සර්වඥයන් වහන්සේ ආශිර්වාද කළා.

දෙමව්පියන් දෙන්නට පුදුම සන්තෝෂයක්. කඳුළු වැගිරෙමින් ම සතුටින් ඇහුවා. 'ස්වාමීනි මේ දරුවාට කොපමණද ආයුෂ' කියලා. මේ දරුවාට අවුරුදු එකසිය විස්සක් ආයුෂ තියෙනවා.' සාධු සාධු ස්වාමීනී. එහෙනම් අපි දරුවාට අදම නමක් තබනවා. ආයුවඩ්ඪන කුමාරයා නමින් නම් කළා.

මේ දරුවාට දැන් තේරෙන්න වයසට පත් වෙන කොට නිති පන්සිල් රකින්න, පොහොය අටසිල් රකින්න පුරුදු වුනා. එක දවසක් අටසිල් සමාදන් වෙලා තමන්ගේ සමාන වයස ඇති දරුවන් එක්ක අටසිල් සමාදන් වෙලා ඉන්න කොට 'අභිවාදන සීලිසස' ගාථාව අහල මේ දරුවා සෝවාන් වුනා. ඉතින් මෙච්චර පින් ඇති දරුවෙකුට නේ හත් දවසේ මාරකයක් තිබුණේ. ඒවා ගෙවා ගන්න පුළුවන් වුනේ රතන සූත්‍රාන්ත දේශනාවේ ආනිසංසයෙන්.

## රතන සූත්‍රාන්ත දේශනාව

මීට අවුරුදු පණහකට වගේ පෙර අපේ පූජනීය මහෝපාධ්‍යාණන් වහන්සේ අපට කියලා දුන්නා අහුන්ගල්ල කියන ගම්මානයේ බොහොම ධනවත් නිවසක නා නා ප්‍රකාරයේ විපත්ති ගෙන දෙන කොඩිවිනයක් වළලා දාලා තිබෙනවා කියලා. ඉතින් දස දහස් ගණන් මුදල් වැය කරමින් බොහෝ අවස්ථාවල තොවිල් ආදිය කරමින් ඇදුරන් ලවා මෙහි ශාන්ති කර්ම කළා. ටික දවසක් කරදර නැති වෙනවා. ආයෙ පටන් ගන්නවා. මෙතෙම කාලාන්තරයක් ගිහින් බැරි තැන - මේ ප්‍රදේශයේ වැඩ හිඳලා තියෙනවා පතමුල්ලේ බෙමගවෙසී කියන් ස්වාමීන් වහන්සේ. ඒ ස්වාමීන් තනියෙන් පිරිත් කියන්නේ. උන්වහන්සේට ආරාධනා කළා වෙන පිහිටක් නැති නිසා.

උන්වහන්සේ වේලාසනින් ම වැඩම කරලා උපදෙස් දුන්නා. ඉස්තෝප්පුව මැද්දෙන් ආසනයක් පණවෙලා පහන් දල්වලා. සුවඳ දල්වලා පිරිස පන්සිල් සමාදන් කරවල හැන්දෑවේ හයට පිරිත පටන් ගත්තා. දේශනා කලේ රතන සූත්‍රය. මුළු රාත්‍රියේම එකසිය අට වාරයක් මෙය දේශනා කරනවා. ඒක හැමදාම උන් වහන්සේ කරන චාරිත්‍රයක්, එවැනි තැන්වලදී. එදා රාත්‍රි දොළහට පමණ මිදුල මැද්දේ

විශාල පිපිරීමක් ඇහුණා. උන්වහන්සේ ඇස් පියන් හිටියා. ගිහින් බලන්න. රියනක් තරම් ප්‍රමාණයේ පොළොව පුපුරලා, කොඩිවිනයක් මතුවෙලා. ඒක ගෙනල්ලා මේ මල් ආසනයේ තියන්න කිව්වා. එළි වෙනකල් පිරිත දේශනා කරලා හමාර කොට දෙවියන්නට පින්දීලා උපදෙස් දුන්නා නම් පුපුරපු කොඩිවිනය ගඟේ ගිහින් දාන්න. එච්චරයි. අමුතුවෙන් දෙහි කපන්න වුනේ නැහැ. පුහුල් කපන්න වුනේ නැහැ. වෙන මොකවත් අවශ්‍ය වුනේ නැහැ. ඒ වෙනුවෙන්, සත පහක් වත් වියදම් වුනේ නැහැ. රතන සූත්‍රයේ තිබෙන බල මහිමය. මේ වගේ පුදුම හාස්කම් රතන සූත්‍රාන්ත දේශනාවේ තියෙනවා.

මීට අවුරුදු පහළොවකට පමණ පෙර ගාල්ලේ කච්චේරියේ සේවය කරන මහත්මයෙක් අප ළඟට ඇවිල්ලා කිව්වා. 'ස්වාමීන් වහන්ස රතන සූත්‍රයේ පුදුම බලයක් මම දැක්කා. 'එතුමාගේ පදිංචි නිවසට සමීපව එතුමාගේ ඉඩමක වටිනා නිවසක් බදුදීලා තිබුණා. බද්දට ඉඳල තියෙන්නේ අබෞද්ධ පිරිසක්. ඒ ඇත්තෝ එළුවන් මරාගෙන, කුකුළන් මරාගෙන අපිරිසිදුව ඉන්නවා. බදු ගෙවන්නෙත් නැහැ. ගේ අස්කරගෙන යන්නෙත් නැහැ. එතුමා බොහෝම ධාර්මික කෙනෙක්. කෙනෙකුගේ හිත රිදෙන්න වචනයක් කියන්නේ නැති ශාන්ත කෙනෙක්. එතුමා දිනක් ඇල්පිටියේ කරුණාරත්න මෑණියන්ගේ ගෙදර ගිහින් තියෙනවා. වෙන කෙනෙකුගේ අවශ්‍යතාවයකට. මිදුලෙ ඉන්න කොට අහන්න ලැබුණා. මේ රතන සූත්‍රාන්ත දේශනාවෙන් දහස් වරක් පිරිත් කියමින් මෙන්න මේ වගේ ප්‍රතිඵල ලැබෙනවා කියලා.

මෙතුමා ගියේ ශාස්තර අහන්න නොවෙයි. ඒක අහගෙන ඉඳලා හිතුවා මමත් මගේ ගෙදර සඳහා එය කරන්නෙම් කියල. ගෙදර ඇවිල්ලා අර බදු ගේ අරමුණු කොට සැමදාම හැන්දෑවට තමන්ගේ රාජකාරිවලින් නිහඩස් වෙලා ආවාම දවසට හත් අට වරක් බැගින් රතන සූත්‍රය කියනවා. මගේ ගේ නිදහස් කර ගන්න ලැබේවා කියලා. දහස් වරක් වුනත් මම කියන්නෙම් කියලා හිතාගෙන පටන් ගත්තේ. සැබවින්ම මාසයක් දෙකක් වගේ යනකොට. දෙසිය වාරයක් තරම් කියන කොට මේ බද්දට හිටිය පුද්ගලයෝ රාත්‍රි කාලයේ අස්වෙලා ගිහින් ද, දවල් කාලේ අස්වෙලා ගිහින් ද කියල දන්නේ නැහැ. ඒ ඇත්තන්ගේ සියලු දේවල් අරගෙන අස්වෙලා ගිහින්. ඉතින් මේ මහත්තයා කියනවා ස්වමීන් වහන්ස වචන මාත්‍රයක් වත් නොදොඩා, නඩු පවරන්නේ නැතිව, හිත නරක් කර ගන්නෙත් නැතිව මේ රතන සූත්‍ර දේශනාවෙන් මට ගේ නිදහස් කර ගන්න ලැබුණා නේ. ඔය වගේ එකක් නොවෙයි. බොහෝ දේවල් අපට අත්දැකීම් ලැබිල තියෙනවා. ඉතින් මේ අනුව සලකා බැලීමේදී රතන සූත්‍ර දේශනාව එදාට පමණක් නොවෙයි අදටත් මේකෙ පුදුම ආනිසංස නෙළාගන්න පුළුවන්.

**අතිපූජ්‍ය නා උයනේ අරියධම්ම නාහිමිපාණන්ගේ ලිපියක් ඇසුරිනි.**


**වසර 17 ක් තුල 6500 කට අධික සාමාජිකත්වයකට භාවනා පුහුණුකල මෙත්සවියේ**

**44 වන ත්‍රෛමාසික චිත්ත සංයමය අභ්‍යාස හා භාවනා වැඩසටහනට**

**2020 මැයි 17 දින පියතබන වගයි.**

මෙත් සවිය


මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

**මඟින් පවත්වනු ලබන මෙම වැඩසටහන තුලින් සම්ප්‍රදායානුකූල බෞද්ධ භාවනා ක්‍රම සහ ලොව පවතින විවිධ භාවනා ක්‍රම කිහිපයක් හඳුන්වාදෙනු ලැබේ.**
**අන් භාවනා ක්‍රම වලට වඩා බෞද්ධ භාවනා වල ඇති හරය මෙතුලින් ඔබට පසක් වනු ඇත.**
**මෙම වැඩසටහන ක්‍රමවත්ව සකසා මෙහෙයවනු ලබන්නේ ප්‍රවීන භාවනා කම්මට්ඨානාචාර්ය විශ්ව විද්‍යාල ඇදුරුතුමෙකු විසිනි.**

මෙහිදී - සමථ භාවනා ක්‍රම, බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, දස කසිනය, පිළිකුල් භාවනාව, මරණානුස්සතිය, දස අශුභය, විදර්ශනා භාවනාව, සක්මන් භාවනාව, බුරුම සහ සියම් භාවනා ක්‍රම, ටිබෙට් හා යෝග භාවනා ක්‍රම හැඳින්වීම, බටහිර මනෝ විද්‍යාවේ සංයම අභ්‍යාස (Relaxation Techniques) හා NLP ක්‍රම හැඳින්වීම, සිතෙහි ඇල්ෆා අවස්ථාව භාවිතයෙන් ලෞකික ජීවිතයේදී සාර්ථකවන ක්‍රම, භාවනාව තුලින් රෝග නිවාරණය වන අන්දම, සතුරන්ට මුහුණ දෙන ක්‍රම, අධ්‍යාපනය සඳහා ධාරණ ශක්තිය වැඩි කරගන්න අන්දම, අනිමිතලෝචන භාවනාව, අටලෝදහම භාවනාව, දෑස් විවෘතව කරන Open eye meditation techniques, පරමොත්කෘෂ්ඨ (TM) භාවනාවට සමාන භාවනා ක්‍රම හඳුන්වා දීම ආදිය.

**2020 මැයි 17 ආරම්භ වන 44 වන වැඩසටහනට සහභාගී වීමට පහත වෙබ් අඩවියෙන් හෝ දුරකථනයෙන් අමතා අයදුම් පතක් ලබාගෙන සම්පූර්ණකර පහත ලිපිනයට තැපැල් කරන්න.**

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org
ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08
සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07



# බිම්තැන්නේ පින්බිම

# මහියංගන සෑයේ අසිරිය

මහියංගණ පුදබිමේ ඉතිහාසය ඓතිහාසික යුගය ද ඉක්මවා යන්නක්. බුදු හිමියන්, බුද්ධත්වයෙන් නව මසක් ඇවෑමෙන් ලංකාවට වඩින විට ලංකාවේ ආර්ය ජනපද ආරම්භ වී නොතිබුණ බව රහසක් නො වේ. මහියංගනය බුද්ධ පාද ස්පර්ශයෙන් පින් බිමක් බවට පත් වන්නේ මෙයින් වසර දෙදහස් හයසිය අටකට පෙරාතුව දුරුතු පුන් පොහෝ දිනයේ දී. වර්තමානයේ ඉහළ කතා බහකට ලක්ව ඇති රාවණා පුරාවෘත්තයන්ට ද මෙකී පිං බිම නෑකම් කියන බවට ඉතිහාස කරුණු සාක්ෂි දරමින් සිටිනවා. දඹදිව පුරා ධර්ම චාරිකාවේ යෙදීමටත් පෙරාතුව සිදු වූ ලංකාගමනය පිළිබඳව ඇතමෙකු දරන මතය වන්නේ අනාගතයේදී බුදුදහම සුරැකෙන මේ දීපයේ ඒ සඳහා සුදුසු පසුබිමක් නිර්මාණය කිරීම සඳහා බුදුන් වහන්සේ මෙහි වැඩිය බවයි.

ඓතිහාසික ජනප්‍රවාදයකට අනුව මහියංගණය යන්න මයිල අංගනය යන්නෙන් විකාශනය වූ බවයි කියවෙන්නේ. පණ්ඩුකාභය කුමරුද සිය මයිලණුවන් හා සටන් කළ ස්ථානය මයිල අංගනය පසුව මහියංගනය වූ බවයි ජන ප්‍රවාදයේ කියවෙන්නේ. තවත් කතාවක කියැවෙන්නේ, මැණික් ගඟ සබඩ තැනිතලා බිම බිම්තැන්න නම් වූ අතර, පාලි භාෂාවෙන් ඒ මහියංගණය නමින් හැඳින් වූ බවයි. කෙසේ වුව ද මධ්‍යම කඳුකරය හරහා ගලා ආ මහවැලි ගඟ එක වරම ඊසාන දෙසට හැරී ගෝකරනය (වර්තමාන ත්‍රිකුණාමලය) බලා යන ගමනේ මනරම්ම හැරයුම වූයේ මහියංගනයයි.

බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩම කරන අවස්ථාවේ, යක්ෂ ගෝත්‍රිකයන් මහා නාග උද්‍යානය නම් වූ ස්ථානයට රැස්ව සම්මේලනය පැවැත්වීමට සූදානම් වෙමින් සිටි බව කියැවේ. ඔවුන්ගේ පරිපාලනය තුළ ඇති කාර්යක්ශම බව සේම සංවිධානාත්මක ව සිය පාලන කටයුතු කළ බවත් එයින් පැහැදිලි වෙනවා. බුදුන් වහන්සේ එහි දී යක්ෂයන් දමනය කල බව පිළිගත හැකි වුවත්, යක්ෂයන් සිය නිජ භූමියෙන් පළවා හල බව මතභේදයට බඳුන්වන්නේ මහාවංශ කතුවරයා මතුකරන, බුදුරජාණන් වහන්සේගේ වර්ණවත් ප්‍රාතිහාර්යන් අතරේ වහන්සේගේ මහා කාරුණික ගුණය, යටපත්ව ගොස් ඇතැයි සැක සිතන බැවිනි.

කෙසේ වුවද උන් වහන්සේගේ ධර්ම දේශනය අවසානයේ දී සෝවාන් ඵලයට සපැමිණි සුමන දෙවියන් දහම් අසා මහත් සද්ධාවෙන් යුක්ත ව වන්දනා මාන කිරීමට කිසිවක් බුදුරජාණන් වහන්සේ ගෙන් ඉල්ලා සිටියදී උන් වහන්සේ සිරස පිරිමැද කේශ ධාතු මිටක් සමන් දෙවියන්ට ලබා දුන් සේක. රුවන්කරඬුවක් මතට බුදුන්වහන්සේගේ කේශ ධාතූන් ලබාගත් සුමන සමන් දෙවියන් පූජාව සඳහා සුදුසු පරිදි ඉඳුනිල් මිනියෙන් කරඬුවක් කරවාලිය. සමන් දෙවි රදුන් විසින් ඉඳුනිල් මිනියෙන් රියන් සතකින් යුත් සෑය කරවන ලද්දේ ය. ලක්දිව ඉදි කරන ලද ප්‍රථම චෛත්‍යය වූයේ ද සමන්දෙවි රජු විසින් ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් කරන ලද ඉන්ද්‍රනීල ස්ථූප නම් සත් රියන් උස මියුගුණු සෑයයි. මෙය බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදීම, බුද්ධත්වයෙන් පළවෙනි වසර තුළදීම ඉදිකරන ලද ලොව ඉදිවුණු පළවෙනිම චෛත්‍යයයි. සමන්ත කූට වර්ණනාවේ මහියංගන සෑය විස්තර කරන්නේ සිංහල දීපය නමැති මහා පොකුණෙහි මැද පිහිටි සුපිපි කුසුමක් බඳු වූ, මහී කාන්තාවගේ අත් මත්තෙහි සුදු පාත්‍රයක හැඩ ඇති සෑයක් ලෙසයි.

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සරභූ නම් ඍද්ධි බල ඇත්තා වූ රහතන් වහන්සේ නමක් බුදු රජානන් වහන්සේගේ චිතකය පැදකුණු කරමින් සිටින අවස්ථාවේ, ගිනි දැල් නොනිමී තියෙද්දිම සඳුන් දර සෑය තුළට අත පොවා ග්‍රීවාස්ථි ධාතුව රැගෙන ඒ මොහොතේ ම ඍර්දියෙන් ලක්දිවට වැඩම කොට මහියංගන සෑයේ ග්‍රීවා ධාතු නිදන් කොට ඉඳුනිල් මිනි සෑය වැසෙන පරිදි මේද වර්ණ නම් පාෂාණයෙන් දොළොස් රියනක් උසට සෑය බඳවන ලදී. සීවලී සහ සුමන නම් වූ ඍර්ධිමත් සාමණේරයන් දෙදෙනෙක් නාග ලෝකයට යවා මේ පාෂාණය ගෙන්වන ලද බවත් රහතුන් වහන්සේ නමකගේ මැදිහත් වීමෙන් ලොව ඉදිවුණු ප්‍රථම චෛත්‍ය මේ බවත් කියැවේ. චාවකොපදෙසටිකා නම් බුරුම ග්‍රන්ථයේ මහ මෙර මුදුනේ ඇති සිළුමිණි සෑය මෙන් ලෝකයේ වන්දනීය සෑය මහියංගනය චෛත්‍ය බවට උපමා කර ඇත .

බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය තිස්හත් වසකට පසුව දේවානම් පියතිස්ස රජුගේ සහෝදර උද්ධ චූලාභය කුමරු විසින් පියවි ගඩොලින් වසා තිස් රියන් උසට මේ සෑය යළිත් අලුතින් බඳවන ලදී. එයද අපූරු කතාවකි. බුද්ධාගම ලංකාවට ගෙන වැඩි සමයේ මහියංගනයට ආසන්න ප්‍රදේශයක ජීවත් වූ උද්ධ චූලාභය කුමරු රහතන් වහන්සේලා සහ දෘශ්‍ය අදෘශ්‍ය දෙවි බඹුන් විසින් නිරන්තරයෙන් වැඳුම් පිදුම් කරන බවත් රාත්‍රී කාලයේ ඇසෙන පංචතූර්ය නාදයන් අසිරිය ද දැන මහත්සේ සේ පැහැදී සිතින් යුක්තව ස්ථූපය යලි ගොඩනංවන ලද බව පැවසේ.

අනතුරුව දුටුගැමුණු රජතුමා සොළීන් හා කරන සටන් වලදී මහියංගනයේ මහවැලි ගඟ අසල කඳවුරු බැඳගෙන සිටින අවස්ථාවේ දී මහියංගන සෑ රදුන් ගේ පුවත අසා දැනගෙන යුද්ධය නිම නි වූ පසුව අසූ රියන් කර සෑය යළිත් අලුතින් ඉදි කරවන ලදි. එම සෑය බුලතා නම් යෝධ පුරුෂයකු විසින් ඉදි කළ බවයි පැවසෙන්නේ. මහා සෑය නිම කිරීමත් සොරබර වැව ඉදිකිරීමත් යන කාර්යයන් දෙකම එක් වරම අවසන් වූ බවයි

පැවසෙන්නේ.

මහියංගන බෝධි රාජයාණන් වහන්සේ අසල ඇති විශාල පුවරුව ද සිරිසඟබෝ රජුගේ ඓතිහාසික පුරාවෘත්තයක් හා සම්බන්ධතාවයක් ඇති බව පැවසේ. මේ ගල විල්ලු ගල ලෙසත් පෙර එය විළිරූ ගල ලෙසත් ප්‍රසිද්ධ වූ අතර සංඝබෝධි කුමරුගේ මව ගැබ් ගෙන සිටියදී මහියංගනය වන්දනා කිරීමට ආසාවක් ඇති වී මහියංගනයට පැමිනි අවස්ථාවේදී විළිරුදා සෑදී එම ගල් පොත්ත මත සිඟිති කුමරුවා බිහි කළ බවයි ප්‍රවාදයේ සඳහන් වෙන්නේ මහියංගන පුදබිමේ ඉදිකර ඇති ඉපැරණි සමන් දේවාලය දෙවැනි රාජසිංහ රජතුමාගේ කාලයේ ඉදි වී ඇත්තේ දෙවියන්ට වූ භාරයක් ඉෂ්ට කිරීමටයි. සමන් දේවාලේ පවතින දුරුතු පෙරහර ප්‍රදේශයේ ජනතාව ඉමහත් සැලකිල්ලක් දක්වනු ලබන කටයුත්තක්.

ඒ සඳහා ආදිවාසීන් පවා සහභාගි වන වැදිනැටුම් වලින් යුක්ත වූ පෙරහැර අවසානයේ සඳහා වැසි ලබා දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලා සිටියි . ආදී වාසීන් මේ පෙරහැරට එක් වන්නේ ඇසළ පෙරහැර අවසාන දිනයේ අලුයම යි. මේ පෙරහරත් මහියංගණ විහාරය ඇසුරු කරගෙන පවතින පෙරහැරත් මනරම් සහ ඓතිහාසික වටිනාකමකින් යුතුයි. දළදා මාලිගාවේ පෙරහැරේදී සිදුකරනු ලබන සියලුම තේවාවන් නොඅඩුව ඉටුකරමින් සියලු සත්කාර මධ්‍යයේ පවත්වනු ලබන මේ පෙරහැරට දළදා මාළිගාවෙන් නිබඳ අනුග්‍රහය ද හිමිවේ.

වර්තමානයේ රාජ්‍ය අනුග්‍රහයෙන් මහියංගන පුදබිමට අයිතිව තිබූ විල්ලූව වැවේ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු වූ අතර සීමාමාලකය සෑදීමේ කටයුතු පහුගිය කාලය තුල අවසන් කර ඇත, මේ වන විට විල්ලූව වැව් මත ඉදිකරන අසූහතර රියන් බුදු පිළිමය, ශ්‍රී විභූතිය ආශ්චර්යය, ප්‍රෞඪමානබව, අභිමානය නැවත මයියංගනයට කැඳවාලන මාහැඟි කලාත්මක සහ අසිරිමත් සද්කාර්යයකි.. මහාචාර්ය චන්දන ජයරත්න මහතා ප්‍රමුඛ ''මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය'' පදනම මේ සඳහා දායකත්වය සපයයි. මේ මහඟු පුණ්‍ය කර්මය සිදු වන බුදුන් වහන්සේ පළමු වරට ලක්දිවට වැඩම කළ මේ පුණ්‍ය භූමියේ උන්වහන්සේ අහසින් වඩන ආකාරය ට ඉදිවෙන මේ මනරම් බුද්ධ ප්‍රතිමාව මෙකී ඓතිහාසික පුණ්‍ය භූමියේ ප්‍රතිභාව තව තවත් වැඩි කරන බවට සැකයක් නැත.

මෙත් සවිය සාමාජිකා - චම්පාවෝ ජයකුමාරි - 39 කණ්ඩායම

## ගුරු පුදට මල් මිටක්

2020.01.24

ගරු, සභාපතිතුමනි.

ජීවිතයේ මා හට අත්දැකීමට සිදුවූ දරුණුම ඛේදවාචකයට පිහිට වූ යමෙක් ඇතිද ඔහු මට දෙවියෙකි උතුම්වූ මනුස්සයෙකි.එවැනි ඉතාමත් බැරෑරුම් අවස්ථාවකින් ගොඩඒමට පිහිටවූ චන්දන ජයරත්න ගුරු, පියාණන් ගැන කීමට මට වචන නැත

එතුමා ඒ අවස්ථාවේ මා තුල සිදුකල මානසික විප්ලවයට ක්ෂණිකව ලබාදුන් අසීමිත සහනයට මා සදා නමස්කාර කරමි.

එතුමා අප වෙනුවෙන් දෙවියෙක් මෙන් පෙනී සිටිමින් අප සියලු දෙනා වෙනුවෙන් මේ කරගෙන යන උත්තම වූ කර්තව්‍ය කිසිදු බාධාවකින් තොරව දේව ආශිර්වාද ලබමින් චිරාත් කාලයක් ලෝක සත්ත්වයා වෙනුවෙන් සුවසේ කරගෙන යාමට සියලු ශක්තිය ධෛර්ය ලැබේවා යැයි මා එක සිතින් ප්‍රාර්ථනා කරමි. එසේම එතුමාට ඒ අජරාමර වූ අමෘතමය නිවන් සුවයෙන් නිවී සැනසීමට ද ලෝක සත්ත්වයා වෙනුවෙන් මේ කරන සේවාව හේතුවේවා කියා අප සිය පවලුම ප්‍රාර්ථනා කරමු.

ස්තුතියි

තෙරුවන් සරණයි

(සාමජික අංකය 27-4093)

(සාමජික අංකය:-33-5196)

11-10-2019

තෙරුවන් සරණයි !

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන ජයරත්න මහත්මයාණෙනි-

වසර හතරකට ආසන්න කාලයක් අසනීප වී සිටි අපගේ දියණිය විඳිනා ලද කායික හා මානසික පීඩාවන්ගෙන් මුදවාගත් ඔබ තුමාට ස්තූතිය පුද කර සිටීමට මෙසේ ලියමි.

විදේශ රටක ජීවත්වන අප ඇයගේ අසනීප සඳහා ප්‍රතිකාර කිරීමට විශේෂඥ වෛද්‍යවරු බොහෝ දෙනෙක් මුණ ගැසුනෙමු. ඒ සඳහා ඉතා අධික මුදලක් වියදම් කිරීමට සිදු විය. එසේ වුවද ඇයගේ අසනීප තත්වයේ අඩු වීමක් නොවුනි. ඇයගේ මෙම තත්වය හේතුවෙන් දෙමාපියන් වශයෙන් අපත්, අනෙකුත් දරුවනුත් විඳි පීඩා අපමණය. එවන් දුක් මැද ජීවත් වූ අපව කලයාණ මිත්‍රයෙකු අපගේ වාසනාවට ඔබ තුමා වෙත යොමු කළේය. ඇය පෙලෙන අසනීපය විනිශ්චය කල ඔබ තුමන් නිර්දේශ කල ප්‍රතිකාර ඉතා ප්‍රායෝගික හා විද්‍යාත්මක වූ අතර ඒ අනුව ක්‍රියා කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබුනි.

මේ වන විට ඇය සුව අතට හැරී ඇති අතර අපගේ දරුවා සුව කිරීමට ඔබ තුමා කළ උපකාරවලට අප සදා ණයගැති වෙමු. අපගේ දරුවා සුව කළ නිසාත් සහ අපගේ සිත්වල තිබූ දුක් කරදර නැති කළ නිසාත් ඔබ තුමා හට චතුරාර්ය සත්‍ය අවබෝධ වේවායි පතමි. ඔබ තුමා කරන මේ සේවය මෙවන් පීඩාවලින් දුක් විඳින සියලු දෙනාටම මහත් සැනසීමකි. ඔබගේ මෙම සේවය තව බොහෝ කල් කරගෙන යාමට ඔබට ශක්තිය හා ධෛර්යය ලැබේවා. ඔබ තුමාට නිදුක් නිරෝගී සුවය සහ දීර්ඝායුෂ පතමි. ඔබ තුමාට බොහොම ස්තූතියි.

තෙරුවන් සරණයි!

Gaulati.

### නමෝ බුද්ධාය

බෝසත් ගුණ රුව පිරී
පින්කෙත රන් හිරු වැනී
සිත් නිවනා සඳ දෙවිඳුන් වන්
අපට මෙලොව කළණ මිතුරු
චන්දන ජයරත්න මැතිඳු
පා පියුම් වඳිමි බැතියෙන
පා පියුම් වඳිමි

සම්මතෑ පිහිටා සැමට ඔවදන් දී
බවුන් වඩා නිවනට මග හෙළිකර දී
කඳුලු සලන්නන් මුවගෙහි හසරැලි මවනා
මිනිස් වෙසින් උපත ලැබූ දෙවිඳුනි අගනා

මෙත් සවියට උපත දී
ඒ දරුනට පියෙකු වී
විශ්වය හඳුනා තුන්ලොව තොරතුරු ගෙනෙනා
ඔබ ඇසුරට පින් කළ අපි ආසිරි ගෙනෙමු
සවිය බලය දිගු ආයුෂ ඔබහට පතමු //

හේලිඅමා සෙනරත්

# 2020/2021 මෙත් සවිය මව් කමිටුවේ පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීම

**මෙත් සවිය මෛත්‍රී සංසදයේ වාර්ෂික මහ සමුළුව, දහහත් වන වර්ෂ පූර්ණ සැමරුම සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල 2020 මැයි මස 3 වන දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ගවේෂි බෞද්ධාශ්‍රම ශාලාවේ දී.**

මෙත් සවිය මව් කමිටුවේ පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීමට කැමති සාමාජිකයින් පහත කොටස පුරවා නොපමාව (සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා) හෝ කාර්යාලයට තැපෑලෙන් හෝ ඊමේල් / ෆැක්ස් මගින් හැකි ඉක්මනින් ලැබෙන්නට සලස්වන්න. මේ දින වල දිනපතා ම පාන්දර බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දී ඉරුදින දහවල් භාවනා වැඩසටහනට පෙර හෝ පසුව හෝ දුරකථන ඇමතුමක් දී, පහසු වේලාවක පැමිණ හෝ හමුවිය හැකිනම් වඩා හොඳය. සුදුස්සන් තේරී පත්වනු ඇත.

මෙයට මෙත් සිතැති,

**මහාචාර්ය චන්දන ජයරත්න මහතා** (සභාපති)

දුරකථනය : 0714 800 800 Email : chandanajayaratne@gmail.com

---

# 2020 / 2021 මෙත් සවිය මව් කමිටුවේ

**මව් / තරුණ / කාන්තා / වෙබ් හා මාධ්‍ය / දාන-සීල-භාවනා සුවසෙත / නීති / සුභසාධක / පර්යේෂණ කමිටු වල**

## නිලතල ඉල්ලීම සඳහා අයදුම් පත්‍රය

**2018 - 2019** වසර දෙකෙහි එකම නිලතල වල හෙබි සාමාජිකයින් නැවත එම තනතුරු සඳහා අයදුම් නොකරන්න. එහෙත් වෙනත් නිලතලයන් ඉල්ලුම් කල හැක.

**නිළතල සඳහා ඉල්ලුම් කරන අය දහමට ලැදි, සමාජ සේවයට කැමති, මෙත් සවිය ගුණ වැඩීමේ ක්‍රමවේදය පුරුදු පුහුණුකරන තැන්පත් අය විය යුතුය. මල් පුදා ගුණ පහ නොවඩන අය අයදුම් කිරීමෙන් වලකින්න.**

**ඉල්ලුම්කරනු ලබන කමිටුවේ නම :**.................................... සාමාජික අංකය :....................

නම :....................................

ලිපිනය :....................................

දුරකථන අංකය :.................................... විද්‍යුත් තැපෑල :....................

....................................

ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :....................................

අයදුම්කරුගේ රැකියාව :.................................... තනතුර :....................

රැකියා ස්ථානයේ ලිපිනය :....................................

අයදුම්කරුගේ පියා හෝ මව කල රැකියාව :....................................

**තෝරාගැනීම පහසු වීම සඳහා වෙනත් අදාල විය හැකි කරුණු,**

ඔබ මෙත් සවිය මගින් කර ඇති පරිත්‍යාග හා අනු කමිටුවල දරන ලද තනතුරු / පුහුණු වැඩසටහන් සඳහා (Please attach a separate sheet or CV):....................................

එක් තනතුරකට වඩා ඉල්ලීම කල හැකිය. සෑම කමිටුවක් සඳහාම අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කල හැක. එක් අයෙකුට කමිටු 2 කට වඩා තනතුරු දැරිය නොහැක. සුදුස්සන් තෝරාපත්කරන්නෙමු. කරුණාකර පහත කොටසේ කොටු තුල තමා වැඩිම කැමති තනතුර ඉදිරියෙන් 1 ලකුණ දමන්න. දෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 2 ලකුණ දමන්න. තෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 3 ලකුණ දමන්න. වත්මන් අනු කමිටු වල තනතුර ලාභීන්ට ද මෙම මව් කමිටු තනතුරු සඳහා ඉල්ලීම කල හැක. එහෙත් මව් කමිටුවට පත්වුවහොත් අනුකමිටු තනතුර අතහැරිය යුතුවේ.

| | | |
|---|---|---|
| **1. ගරු සභාපති** ☐ | **2. ගරු උප සභාපති** ☐ | **3. ගරු සම ලේකම්** ☐ |
| **4. ගරු භාණ්ඩාගාරික** ☐ | **5. ගරු උප භාණ්ඩාගාරික** ☐ | **6. ගරු සංස්කාරක** ☐ |
| **7. ගරු කාරක සභික** ☐ | | |

ඉහත නිලතල බලාපොරොත්තු නොවන එහෙත් කමිටු සාමාජිකත්වය පමණක් බලාපොරොත්තු වන අය තමා කැමති කමිටුවේ / කමිටුවල නම / නම් (උපරිම කමිටු 2ක් පමණි) මෙහි ලියන්න. :....................................

අයදුම්කරුගේ අත්සන :.................................... දිනය : ........../........../..........

මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය 17 වර්ෂ පූර්ණ සංවත්සර මහෝත්සවය 2020 මැයි 03

# මෙත් සවිය සාමාජිකයින් සඳහා පසුගිය වසර දෙක තුල කල සේවය වෙනුවෙන් විශිෂ්ඨ සේවා සම්මාන පිරිනැමීමේ අයදුම්පත්‍රය

(අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020/4/10)

01. සම්පූර්ණ නම ....................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................

(ඡායා පිටපතක් අමුණාන්න)

04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................

07. ස්ථිර ලිපිනය ....................

විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:කඃ නිවස .................... ජංගම ....................

08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................

10. රැකියාව හා තනතුර ....................

11. ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ....................

කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ....................

12. ලිපි එවිය යුතු ලිපිනය ....................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ....................
2. ....................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ....................
2. ....................
3. ....................

15. සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන තොරතුරු සැකවින්, (2019/4/5 සිට 2020/4/5 දක්වා කටයුතු)
(ඉඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කඩදාසි අමුණාන්න)

තොරතුරු සනාථ කිරීමට අත්‍යාවශ්‍ය නැත. එහෙත් තොරතුරු හෝ වෙනම ඇමුණුම් ඉදිරිපත් කල හැක. ඇමුණුම් අංකය :

1. ....................
2. ....................
3. ....................
4. ....................
5. ....................
6. ....................
7. ....................
8. ....................
9. ....................
10. ....................

**සභාපති - ලකුණු 15 / භාණ්ඩාගාරික, සංස්කාරක, ලේකම් - ලකුණු 10 / අනෙකුත් නිලතල සඳහා - ලකුණු 8 බැගින් හා සංගමය වෙනුවෙන් කල වැඩකටයුතු හා සේවා සඳහා, එක් කරුණක් වෙනුවෙන් ලකුණු 5 ක් උපරිම ලැබේ.**

**ලකුණු සීමාව : කුසලතා : 50 - 74 / ලෝකඩ : 75 - 99 / රිදී : 100 - 124 / රන් : 125 සිට ඉහලට**

**සැ.යු: ලැබෙන අයදුම්පත් ප්‍රමාණය මත ඉහත ලකුණු සීමා අඩු/වැඩි වීමට ඉඩ ඇත.**

16. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ....................

....................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දීම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම් වන චින්තක බණ්ඩාර මහතාගේ පුද්ගලික දුරකතන අංකය (0718 114 477) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 44 වන භාවනා වැඩසටහන

44 වන භාවනා වැඩසටහන 2020 මැයි මස 17 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2020/04/01 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. ඉන්පසු ලැබෙන අයදුම්පත් ද ඉඩකඩ තිබුනහොත් සලකා බලනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 38 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 38 වන වැඩමුළුව 2020 - 02 - 23 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 39 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2020 - 05 - 03 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.


**T.S.H.TECHNOLOGIES**

**පරිගනක, රූපවාහිනී**
**අලුත්වැඩියාව / ශබ්දවාහිනී**
**උපකරණ නිපදවීම සහ**
**නව නිර්මාණ කරණය**
**071 66 00 317**
(සාමාජික - 43 කණ්ඩායම)

**ගණකාධිකරන හා මූල්‍ය සේවා**

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිලියෙලකිරීම්,
ආදායම් බදු හා මූල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

**දිදුලක ක්‍රියේෂන්ස්**

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස
**මුතුකුඩ නිර්මාණය**
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
**සාරි නිර්මාණය කරනු ලැබේ**
**සාමාජිකා - දිලිනි**
බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (සා.අංක. **34-5228**) නැගී සිටීමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය
භාර දීමට විමසන්න - **0772 353 392**

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**
**SIGHT 'N' STYLE OPTOMETRISTS**



නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**ජල රකුසාගෙන් ගැලවෙමු ග්‍රන්ථය**
කර්තෘ : පියදාස සිල්වා (සා:අ: **15-2738**)




- භාවනාව • ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුද්‍රණ වියදම රු. 350**
**අලෙවි මිල රු. 250**
දු:ක: 075 712 8960

**පසුගිය වසරේ ලාභය බුදු පිළිමය තැනීම සඳහා පිරිනමන ලදී**

**මැහුම් කලාව පුහුණු කිරීම**



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම**. නිවස අලංකාරයට **බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදී බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බ්ලවුස් සහ සාරිය දක්වාත්,**
නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි
ඉතා සියුම් නිර්මාණ පුහුණු කරණු ලැබේ.
**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**
**(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)**

# මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

01. සම්පූර්ණ නම ..........

02. ස්ත්‍රී / පුරුෂ භාවය .......... 3. ජාතික හැඳුනුම්පත් අංකය ..........

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .......... 5. වයස .......... 6. ආගම ..........

07. ස්ථිර ලිපිනය ..........

විද්‍යුත් තැපෑල (e-mail) .......... දු:ක: නිවස .......... ජංගම ..........

08. දිස්ත්‍රික්කය .......... 9. විවාහක / අවිවාහක බව ..........

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .......... / පිරිමි දරුවන්ගේ වයස් ..........

11. රැකියාව හා තනතුර ..........

ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..........

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..........

13. ලිපි එවිය යුතු ලිපිනය ..........

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ..........

2. ..........

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..........

2. ..........

3. ..........

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..........

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

..........

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..........

..........

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .......... අයදුම්කරුගේ අත්සන ..........

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..........

.......... ..........

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..........

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අඟහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org

**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**

2019 සැප්: 08
වන දින වැල්ලවත්ත
ශ්‍රී විජයාරාමයේ දී
පවත්වන ලද
ඇස් පරීක්ෂාව සහ
ඇස්කන්නාඩි ලබාදීමේ
වැඩසටහන












2019 අගෝස්තු 04
වන දින වැල්ලවත්ත
ශ්‍රී විජයාරාමයේ දී
පවත්වන ලද
ලේ දන්දීමේ
පුණ්‍යකර්මය.





මෙත් සවිය
මගින් සිදුකරන ලද
පරිත්‍යාගයන්
කිහිපයක්...





2019.12.24 දින
මැදිරිගිරිය ප්‍රදේශයේ
අධ්‍යාපනය ලබන
දූ දරුවන් වෙනුවෙන්
පාසල් උපකරණ
පරිත්‍යාග කිරීම.





2019 ජූලි 18 - 21
දිනයන් හි බණ්ඩාරනායක
සම්මන්ත්‍රණ ශාලාවේදී
පැවති ශිල්පසේනා ප්‍රදර්ශනය
සඳහා මෙත් සවිය
පර්යේෂණ කමිටුවේ
සහභාගීත්වය.






2019 සැප්: 11 - 15
දිනයන් හි
පොළොන්නරුවේ දී
පැවති ශිල්පසේනා ප්‍රදර්ශනය
සඳහා මෙත් සවිය
පර්යේෂණ කමිටුවේ
සහභාගීත්වය.






2020
ජනවාරි 1 වන දින
වසරේ පළමු
හීල්දානමය පිංකම
කොළඹ ගංගාරාම
විහාරස්ථානයේ දී
පැවැත්වීම.










2020
ජනවාරි 1 වන දින
ජයන්ති ළමානිවාසයේ
දූදරුවන් වෙනුවෙන්
දහවල් දානය හා
අවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග
කිරීම









2019
දෙසැම්බර් 09 වන දින
බුදුපිළිමය තැනීම පිළිබඳ
බණ්ඩාරනායක
සම්මන්ත්‍රණ ශාලාවේදී
පැවැත් වූ මාධ්‍ය
සාකච්ඡාව.




2019
දෙසැම්බර් 09 වන දින
බුදුපිළිමය තැනීම පිළිබඳ
බෞද්ධයා රූපවාහිනියේ දී
පැවැත් වූ මාධ්‍ය
සාකච්ඡාව.

මහියංගන රාජමහා විහාරාධිපති අතිපූජ්‍ය පණ්ඩිත උරුලෑවත්තේ ශ්‍රී ධම්මරක්ඛිත නායක හිමිපාණන් වහන්සේ / බෞද්ධයා මාධ්‍ය ජාලයේ සභාපති, සම්බෝධි විහාරාධිපති, පූජ්‍ය බොරලන්දේ වජිරඥාන ස්වාමීන් වහන්සේ සහ මෙත් සවිය සභාපති, මහාචාර්ය චන්දන ජයරත්න මහතා බෞද්ධයා රූපවාහිනී මාධ්‍යසාකච්ඡාවට සහභාගී වෙමින්.




ඩිලාසර් ප්‍රින්ටර්ස් 2/99, කඩවල පාර, කුණ්ඩලගොඩ 011 2827044 / 0712 285 680